# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2026

2024 හා 2025 වර්ෂවලට නියමිත බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 නොවැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. විභාග මධ්‍යස්ථාන :- **උප ලේඛනය 01 හි** දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී නගරයේ විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

03. භාෂා මාධ්‍යය:- මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි. අයදුම්පතේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. සුදුසුකම් :- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සමත්ව සිටීම හෝ

4.2 ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත්ව සිටීම හෝ

4.3 පිරිවෙන් අවසාන විභාගය සමත්ව සිටීම හෝ

4.4 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්ව සිටීම

05. අයදුම් කිරීම :-

5.1. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2025.11.06 වන දිනට ලියාපදිංචි දහම් පාසල්වලට අවශ්‍ය අයදුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මඟින් මේ වන විට යොමු කර ඇති අතර www.donets.lk වෙබ් අඩවිය මඟින් ද බාගත කර ගැනීමේ පහසුකම සලසා ඇත.

5.2 කවර හෝ පුද්ගලයකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 04 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මඟින් රු. 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත ප්‍රධානාචාර්යවරයා වෙත තබා ගත යුතුය. අයදුම්පත් දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතුය.

5.4 මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

5.5 අයදුම්පත් භාර ගැනීම **2026 අගෝස්තු මස 21** දිනෙන් ආරම්භවී **2026 සැප්තැම්බර් මස 21** දිනෙන් අවසන් වේ.

5.6 අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයටම විය යුතු අතර ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්ය වේ. ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.7 විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකව පරීක්ෂා කර බලා අත්සන් කළ යුතු අතර සියලු අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා ළඟ තබා ගත යුතු වේ.

5.8 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන ප්‍රධානාචාර්යවරයා වගකිව යුතුය.

5.9 දහම් පාසලේ ලියාපදිංචි අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. දහම් පාසලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වමත් පස කෙළවරේ **"බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2026"** යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

5.10 තැපැලේදී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් පිළිබඳ වගකීම දහම් පාසල් ප්‍රධානීන් විසින් භාර ගත යුතුය.

06. විභාග ගාස්තු :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන දහම් පාසල් අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා විභාග ගාස්තුව රු. 50/-කි.

6.1 විභාග ගාස්තු ගෙවීම : අදාළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා විසින් ගාස්තු ගෙවිය යුතු සියලුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක **20-03-02-13**ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා කුවිතාන්සිය ලබාගෙන එම කුවිතාන්සිය අයදුම්පතේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීම හෝ සිදු කරනු නොලැබේ.

07. ප්‍රවේශ පත්‍ර :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින්ම ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. යම් අයදුම්කරුවකු තම විභාග ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල අයත් විහාරස්ථානයේ විහාරාධිපති හිමි හෝ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ ග්‍රාම නිලධාරි හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනාරල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

1. විභාගයේ නම
2. දහම් පාසලේ නම හා දුරකථන අංකය
3. දහම් පාසලට ලබාදී ඇති පරිගණක අංකය
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම
5. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය/ නගරය
6. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය
7. අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය
8. විභාග ගාස්තු ගෙවූ ලදුපත් පිටපත

08. අනන්‍යතාව :- විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

09. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :- මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන පහක් වන අතර, විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් පහෙන්ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂයයන් පහෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. ඌන සාමර්ථ්‍යය ලබාගත් වර්ෂයේ සිට අනුගාමී විභාග අවස්ථා තුනක් (03) ඇතුළත එම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ හැක. ඌන සාමර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයයට පමණි. එක් විෂයයකට වඩා අසමත් වී ඇත්නම් සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටිය යුතුවේ. යම්කිසි අපේක්ෂකයකු ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කර ඇත්නම් ඒ බව විභාගයේ ප්‍රතිඵල නිකුත් කර තෙමසක් ඉකුත්වීමට පෙර නියෝජ්‍ය විභාග කොමසාරිස් (ආයතනික විභාග ප්‍රතිඵල) වෙත ලියා දැන්විය යුතුය.

10.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත් වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය | සංකේතය |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

10.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මඟින් එවනු ලැබේ.

10.3 විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. සහතික පත්‍ර :- මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මඟින් ලබා දෙනු ඇත. විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණ යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳව දහම් පාසල් ප්‍රධානාචාර්ය මඟින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙන් ලිඛිතව විමසීම් කළ යුතුය.

12. උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :- දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30 ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

13. විෂය නිර්දේශය :- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කර පැවැත්වීමට නියමිත බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය උපලේඛන 02 ලෙස මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත.

14. මෙම නිවේදනයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්

2026 අගෝස්තු මස 17 වැනි දින
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

## 01 උපලේඛනය

### ඒ ඒ දිස්ත්‍රික්කයන් හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

මගේ අංකය :- 5/2/4/18/2025

ආයතනික විභාග සංවිධාන ශාඛාව,

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,

පැලවත්ත, බත්තරමුල්ල.

2026.08.25

දහම් පාසල් ප්‍රධානීන් වෙත,

## බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2026
## අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

2024 හා 2025 වර්ෂවලට අදාළ උක්ත විභාගය සඳහා අයදුම්පත් මේ සමඟ එවා ඇත. පිටපත් 02 කින් යුතු මෙම අයදුම්පත්වල සම්පූර්ණ කළ යුතු සියලුම තොරතුරු ඒකාකාරි ලෙස ඇතුළත් කර පළමු වන පිටපත (කොළ පැහැති) විභාග දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන්න. දෙවන පිටපත (සුදු පැහැති) ඔබ දහම් පාසලේ සුරැකිව තබා ගන්න. සියලුම අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් කිරීමට ලබාදී ඇති අයදුම්පත ප්‍රමාණවත් නොවන්නේ නම් අයදුම්පත ඡායා පිටපත් කර ගැනීමට හෝ **www.doenets.lk** විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කිරීමට හැකියාව ඇත.

2. අයදුම්පතෙහි 2.0 ශීර්ෂය යටතේ ඔබ දහම් පාසල වෙත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති ඉලක්කම් 07කින් යුත් දහම් පාසල් පරිගණක අංකය **(User Name)** සඳහන් කළ යුතුය. මෙම අයදුම්පත් එවන ලද ලිපි කවරයේ අලවා ඇති ඔබගේ ලිපිනයේ **SCH NO.** යනුවෙන් සඳහන්ව ඇත්තේ එම අංකයයි. දහම් පාසලට අදාළ කරුණු පිළිබඳව විමසීමේදී මෙම පරිගණක අංකය සඳහන් කළ යුතුය.

3. අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර එහි පිටුපස මුද්‍රණය කර ඇති උපදෙස් ඉතා සැලකිල්ලෙන් කියවන ලෙස කාරුණිකව දන්වමි. **අයදුම්පතෙහි අවසානයෙහි දහම් පාසල් ප්‍රධානාචාර්යගේ නම, අත්සන හා දිනය යොදා දහම් පාසල් නිල මුද්‍රාව තැබිය යුතුය.**

4. බාහිර අයදුම්කරුවන්ට පෞද්ගලිකව විභාගයට අයදුම් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. එවැනි අයදුම්කරුවන් තම පදිංචි ස්ථානයට ආසන්නව ඇති දහම් පාසල මඟින් අයදුම් කළ යුතු බවට ඔවුන් වෙත උපදෙස් ලබා දී ඇත. එබැවින්, ඔබ ප්‍රදේශයේ යම් බාහිර අයදුම්කරුවකු පැමිණ මෙම විභාගයට ඉදිරිපත් වීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටියහොත් ඔහුගේ / ඇයගේ සුදුසුකම් ගැසට් නිවේදනයේ සඳහන් පරිදි සපුරා ඇති බව සනාථ කර ගෙන (නියමිත සුදුසුකම් සපුරා ඇති බවට ලිපියක් හා ජාතික හැඳුනුම්පතේ පිටපතක් ලබාගෙන දහම් පාසලේ රඳවා ගත යුතුය.) විභාග ගාස්තු අයකර ඔබගේ දහම් පාසල මඟින් අයදුම් කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස විශේෂයෙන් ඉල්ලා සිටිමි.

5. මෙම විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා නියමිත විෂයයන් 05ම සමත් විය යුතුය. කෙසේ වෙතත් විෂයයන් 04ක් සමත් වී එක් විෂයයක් අසමත් වූයේ නම් ඌන සාමර්ථ්‍යයක් ලැබෙනු ඇත. ඌන සාමර්ථ්‍යය ලබාගත් වර්ෂයේ සිට අනුගාමී විභාග අවස්ථා 03ක් ඇතුළත ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සමත්වීමෙන් සම්පූර්ණ සාමර්ථ්‍යය ලබාගත හැක. **එක් විෂයයකට වඩා අසමත් වී ඇත්නම් සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටිය යුතුවේ.**

6. යම්කිසි අපේක්ෂකයකු ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කර ඇත්නම් ඒ බව විභාගයේ ප්‍රතිඵල නිකුත් කර තෙමසක් ඉකුත්වීමට පෙර නියෝජ්‍ය විභාග කොමසාරිස් (ආයතනික විභාග ප්‍රතිඵල) වෙත ලියා දැන්විය යුතුය.

7. මෙම විභාගයට පෙනී සිටින ඔබ දහම් පාසලේ අධ්‍යාපනය නොලබන බාහිර අයදුම්කරුවන්ගෙන් පළමුවරට විභාගයට පෙනී සිටීමේදී රු. 200/-ක විභාග ගාස්තුවක් අය කර ගත යුතුය. එහෙත් දහම් පාසලේ අධ්‍යාපනය ලබන අයදුම්කරුවන් පළමුවන අවස්ථාවේදී පමණක් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට අයදුම් කරන විෂයය සඳහා රු. 50/-ක් ද සම්පූර්ණ විභාගයට දෙවන වරට හෝ ඊට පසු වාරයක් සඳහා පෙනී සිටින විට රු. 200/-ක් ද වශයෙන් විභාග ගාස්තු ගෙවිය යුතුය. අයදුම්කරුවන් සියලු දෙනාටම අදාළ වන මුළු විභාග ගාස්තුව දිවයිනේ ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද **කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පත සමඟ අමුණා එවිය යුතු වේ.** කුවිතාන්සියේ ඡායා පිටපතක් ලබා ගෙන එය සුරැකිව ඔබ වෙත තබා ගන්න.

8. අයදුම්පතේ දැක්වෙන නගරවල පමණක් විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන බැවින් එම නගරවලට අමතරව වෙනත් නගරවල නම් සඳහන් නොකළ යුතුය. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන කැමැත්ත අනුව හෝ අයදුම්කර ඇති මධ්‍යස්ථානයට සමීප මධ්‍යස්ථානයක් වෙත හෝ යොමු කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ පසු කිසිදු හේතුවක් මත විභාග මධ්‍යස්ථානය වෙනස් කරනු නොලැබේ. අනවසරයෙන් වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල අත්හිටුවීමට කටයුතු කෙරේ.

9. අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේදීම තමා අයදුම් කරන විෂයයන් පිළිබඳව මනා අවබෝධයකින් යුතුව සඳහන් කළ යුතු අතර කවර හේතුවක් නිසාවත් විභාගය පැවැත්වෙන අවස්ථාවේදි අයදුම් කර ඇති විෂයයන් හා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. ජාතික හැඳුනුම්පත් අංකය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍ර අංකය හෝ නිවැරදිව අනිවාර්යයෙන් සටහන් කරන්න. තමන්ගේ සම්පූර්ණ නම හා අනෙකුත් විස්තර නිවැරදිව ඇතුළත් කර ඇති බව හොඳින් සනාථ කර ගත් පසුව, අයදුම්පතේ තම අත්සන යෙදිය යුතු බවට අයදුම්කරුවන්ට උපදෙස් ලබා දෙන්න. සෑම අයදුම්කරුවකුම අයදුම්පතේ අංක 14.0 යටතේ තම අත්සන තැබිය යුතු අතර එසේ අත්සන් කරවා ගැනීම දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයාගේ වගකීම වේ.

11. අයදුම්පත් බහා එවීම සඳහා විභාග දෙපාර්තමේන්තුවේ ලිපිනය සඳහන් කවරයක් මේ සමඟ එවා ඇත. එහි විභාගයට අයදුම් කරන නගරය හා නගර අංක ද දහම් පාසලට හිමි පරිගණක අංකය ද අදාළ කොටුව තුළ පැහැදිලිව සටහන් කර එවිය යුතුය. අයදුම්පතේ **මුල් පිටපත (කොළ පැහැති) විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට 2026 සැප්තැම්බර් මස 21 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කාරුණිකව දන්වමි. ප්‍රතික්ෂේපිත අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලබන බව වැඩිදුරටත් දන්වමි.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පසු පිටුවේ සඳහන් උපදෙස් හොඳින් කියවන්න.

**<u>අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් සම්පූර්ණ කරන්න.</u>**

මෙම අයදුම්පත සම්පූර්ණ කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන්න.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 202.......

1.0 දහම් පාසලේ නම සහ ලිපිනය

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

1.1 දහම් පාසල අයත් දිස්ත්‍රික්කය :-................................................................

1.2 දිස්ත්‍රික් අංකය :-................................................................

1.3 දුරකථන අංකය :-................................................................

2.0 ඔබ දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය (SCH. NO.)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

2.1 විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් ගණන මාධ්‍ය අනුව

| | |
|---|---|
| සිංහල මාධ්‍යය | |
| ඉංග්‍රීසි මාධ්‍යය | |
| මුළු අයදුම්කරුවන් ගණන | |

3.0 විභාගයට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය
(පසුපිටෙහි සඳහන් ලේඛනය අනුව)

| | |
|---|---|
| පළමු තේරීම :- ................................ | නගර අංකය |
| දෙවන තේරීම :- ................................ | නගර අංකය |

| 4.0 | 5.0 | 6.0 | 7.0 | 8.0 | 9.0 | 10.0 | | | | | 11.0 | 12.0 | 13.0 | 14.0 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | වාසගම සහිත සම්පූර්ණ නම<br><br>උදාහරණ :- REV. RAKWANE DHAMMARATHANA<br>SILMATHA MEEPE SUBHA<br>RANASINGHE ARACHCHIGE JAGATH<br><br>*අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ආකාරයටම නම අයදුම්පතෙහි ද සඳහන් කරන්න. | ජාතික හැඳුනුම්පත් අංකය | මාධ්‍යය<br><br>සිංහල - 2<br>ඉංග්‍රීසි - 4<br>(අදාළ අංකය ලියන්න) | ස්ත්‍රී/ පුරුෂ භාවය<br><br>ස්ත්‍රී - 1<br>පුරුෂ - 0<br>(අදාළ අංකය ලියන්න) | ජංගම දුරකථන අංකය | විෂයයන්<br><br>ථේරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම | බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය | අභිධර්මය | බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය | බෞද්ධ සමාජ දර්ශනය | ඌන සාමර්ථ්‍යයක් නම් එම අවස්ථාවේදී විභාගයට පෙනී සිටි විභාග අංකය | ඌන සාමර්ථ්‍යය ලබා ගත් වර්ෂය | ගෙවූ මුදල (රුපියල්)<br><br>**නිදහස් නම් "F" ලියන්න** | අයදුම්කරුගේ අත්සන |
| | | | | | | 01 | 02 | 03 | 04 | 05 | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

15.0 දහම් පාසල් ප්‍රධානාචාර්යගේ සහතිකය:

ඉහත නම් සඳහන් අයදුම්කරුවන්, මෙම දහම් පාසලේ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් බවත්, ගැසට් නිවේදනයේ 04 වන ඡේදය යටතේ දක්වා ඇති අවශ්‍යතාවන් සපුරා ඇති බවත්, ඔවුන් මා ඉදිරියේදී අත්සන් තැබූ බවත් අයදුම්කරුවන් ............................................. ගෙන් අයකර ගන්නා ලද මුළු මුදල වන රුපියල් .............................................ක් තැපැල් කාර්යාලයට ගෙවා ඒ වෙනුවෙන් ලද අංක .................................. හා ..................................... දින දරන කුවිතාන්සිය පසු පිටුවේ අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

දහම් පාසලේ නම / ලිපිනය සහිත මුද්‍රාව තබන්න.

සකස් කළේ : නම ...................................................................

අත්සන : ........................................ දිනය .......................

පරීක්ෂා කළේ : නම ...................................................................

අත්සන : ........................................ දිනය .......................

දහම් පාසල් ප්‍රධානියාගේ නම : ...................................................................

අත්සන : ........................................................... දිනය ..........................

## අයදුම්පත පිරවීම සඳහා උපදෙස්

1.0 දහම් පාසලේ නම සහ ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න. (දහම් පාසලේ නම පළමුවෙන් ද තැපැල් ලිපිනය එයට යටින් ද සඳහන් කරන්න.)
   1.1 දහම් පාසල අයත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න.
   1.2 පහත සඳහන් ලේඛනයට අනුව දහම් පාසල අයත් දිස්ත්‍රික්කයට අදාළ අංකය ද නිවැරදිව සඳහන් කරන්න.
   1.3 දහම් පාසලේ දුරකථන අංකය සඳහන් කරන්න.
2.0 ඔබ දහම් පාසලට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති ඉලක්කම් 7කින් යුත් පරිගණක අංකය (SCH. NO.) අදාළ කොටුව තුළ සඳහන් කරන්න.
   2.1 එක් එක් මාධ්‍යය අනුව විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් සංඛ්‍යාව හා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව අදාළ කොටු තුළ සඳහන් කරන්න. එක් පත්‍රිකාවකට වඩා භාවිත කරන්නේ නම් මුළු අයදුම්කරුවන් ගණන මුල් පිටුවට නිවැරදිව ගෙන ආ යුතුය.
3.0 මෙහි පහතින් දක්වා ඇති ලේඛනයෙන් විභාගයට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය තෝරන්න. මෙහිදී වඩාත් පහසු නගරය පළමු තේරීම ලෙස ද විකල්ප ලෙස යොදා ගත හැකි නගරයක් දෙවන තේරීම ලෙස ද අදාළ නගර අංක ද සමඟ ඇතුළත් කරන්න.
4.0 එක් පත්‍රිකාවක ඇතුළත් කරන අයදුම්කරුවන්ට අදාළ අනු අංක 01, 02, 03,... ආදි වශයෙන් සඳහන් කරන්න. නමක් ඇතුළත් කිරීම සෑමවිටම අලුත් රූලකින් ආරම්භ කරන්න. එක් පත්‍රිකාවක් ප්‍රමාණවත් නොවන්නේ නම්, තවත් මෙවැනි පත්‍රිකාවක් යොදා ගත යුතු අතර අවසාන පත්‍රිකාවේ අවසන් අයදුම්කරු දක්වාම අනු අංක පිළිවෙළට සඳහන් කරන්න.
5.0 ජාතික හැඳුනුම්පතෙහි සඳහන් ආකාරයටම වාසගම සහිත සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතුය. (මුල් පිටුවේ 5.0 කොටුවේ දී ඇති උදාහරණ බලන්න. තව ද නම ඇතුළත් කිරීම සඳහා එක් රූලක් ප්‍රමාණවත් නොවන විටක, ඊළඟ රූල ද යොදා ගත හැකි අතර ඒ අනුව 4.0 වන තීරුවේ අනු අංක නිවැරදිව සටහන් කිරීමට වග බලා ගන්න.) සිංහල හා ඉංග්‍රීසි යන එක් එක් මාධ්‍යයෙන් පෙනී සිටීමට නියමිත පැවිදි අයදුම්කරුවන්ගේ නම් මුලින් ද ගිහි අයදුම්කරුවන්ගේ නම් ඊළඟට ද මාධ්‍ය පිළිවෙළින් ඇතුළත් කරන්න.
6.0 සියලුම අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍ර අංකය හෝ නිවැරදිව සඳහන් කරන්න. ඇතුළත් කරන එම අංකයට අදාළ ලේඛනයේ ඡායා පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා ළඟ තබා ගත යුතු වේ.
7.0 පෙනී සිටින මාධ්‍යය සිංහල නම් අංක 2 ද ඉංග්‍රීසි නම් අංක 4 ද සඳහන් කරන්න.
8.0 ස්ත්‍රී/ පුරුෂ භාවය සඳහන් කිරීමේදී පුරුෂ නම් 0 ද ස්ත්‍රී නම් 1 ද සඳහන් කරන්න.
9.0 එක් එක් අයදුම්කරුවන්ගේ ජංගම දුරකථන අංකය සඳහන් කරන්න.
10.0 ඉල්ලුම් කරන විෂයයන් සටහන් කිරීමේදී එක් එක් විෂයයට අදාළ අංකය (01, 02, 03, 04, 05) යොදන්න. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට නම් ඊට අදාළ විෂය අංකය සඳහන් කරන්න.
11.0 සම්පූර්ණ විභාගයට පෙනී සිට එක් විෂයයක් අසමත් වන අයදුම්කරුවන් ඌන සමත් ලෙස සලකන අතර, එම අසමත් විෂයය සඳහා පමණක් පෙනී සිට සාමර්ථ්‍යය ලබා ගැනීමෙන් විභාගය සම්පූර්ණ කළ හැකිවේ. ඒ අනුව අදාළ අයදුම්කරුවන් ඌන සාමර්ථ්‍යය ලත් වර්ෂයේ විභාග අංකය සඳහන් කරන්න.
12.0 ඌන සාමර්ථ්‍යය ලත් වර්ෂය සඳහන් කරන්න.
13.0 මෙම විභාගය සඳහා පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුවේ. ගාස්තුවලින් නිදහස් අයදුම්කරුවන්ගේ නම් ඉදිරියෙන් **"F"** යනුවෙන් සඳහන් කරන්න. සියලු ගෙවීම්වලට අදාළ ලදුපතේ මුල් පිටපත (16) හි අලවා එවිය යුතු වේ.

| පෙනී සිටින අවස්ථාව | දහම් පාසල් අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු විභාග ගාස්තු | බාහිර අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු විභාග ගාස්තු |
|---|---|---|
| ප්‍රථම වතාව | නිදහස් | රු. 200/- |
| දෙවන වතාව සහ ඊට පසු වතාව | රු. 200/- | රු. 200/- |
| ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා | රු. 50/- | රු. 50/- |

14.0 තම නම, තමන් පෙනී සිටින විෂයයන් හා අයදුම්කරුවන්ගේ අනෙකුත් තොරතුරු සියල්ල නිවැරදි දැයි පරීක්ෂා කිරීමෙන් අනුතුරුව තම අත්සන යොදන ලෙසට අයදුම්කරුවන් දැනුවත් කර අයදුම්කරුවන්ගේ අත්සන් ලබා ගන්න.
15.0 අයදුම්කරුවන්ගේ නම්, ඔවුන්ගේ අත්සන්, ගෙවන ලද විභාග ගාස්තු හා අනෙකුත් තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කර බලා දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් අත්සන් කර නම හා දිනය ද සඳහන් කළ යුතුය. වෙන් කර ඇති ස්ථානයේ දහම් පාසලේ මුද්‍රාව තබන්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම දහම් පාසල් ප්‍රධානියාගේ වගකීම වේ.

### විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක /නගර ලේඛනය

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

**16**

තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය මෙහි අලවන්න.

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පසු පිටුවේ සඳහන් උපදෙස් හොඳින් කියවන්න.
**<u>අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් සම්පූර්ණ කරන්න.</u>**

මෙම අයදුම්පත සම්පූර්ණ කර දහම් පාසලෙහි සුරැකිව තබාගන්න.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 202.......

1.0 දහම් පාසලේ නම සහ ලිපිනය

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

1.1 දහම් පාසල අයත් දිස්ත්‍රික්කය :-..........................................................................

1.2 දිස්ත්‍රික් අංකය :-..........................................................................

1.3 දුරකථන අංකය :-..........................................................................

2.0 ඔබ දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය (SCH. NO.)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

2.1 විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් ගණන මාධ්‍ය අනුව

| | |
|---|---|
| සිංහල මාධ්‍යය | |
| ඉංග්‍රීසි මාධ්‍යය | |
| මුළු අයදුම්කරුවන් ගණන | |

3.0 විභාගයට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය
(පසුපිටෙහි සඳහන් ලේඛනය අනුව)

පළමු තේරීම :- ................................ නගර අංකය

දෙවන තේරීම :- ................................ නගර අංකය

| 4.0 | 5.0 | 6.0 | 7.0 | 8.0 | 9.0 | 10.0 | | | | | 11.0 | 12.0 | 13.0 | 14.0 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | වාසගම සහිත සම්පූර්ණ නම<br>උදාහරණ :- REV. RAKWANE DHAMMARATHANA<br>SILMATHA MEEPE SUBHA<br>RANASINGHE ARACHCHIGE JAGATH<br>*අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ආකාරයටම නම අයදුම්පතෙහි ද සඳහන් කරන්න. | ජාතික හැඳුනුම්පත් අංකය | මාධ්‍යය<br>සිංහල - 2<br>ඉංග්‍රීසි - 4<br>(අදාළ අංකය ලියන්න) | ස්ත්‍රී/ පුරුෂ භාවය<br>ස්ත්‍රී - 1<br>පුරුෂ - 0<br>(අදාළ අංකය ලියන්න) | ජංගම දුරකථන අංකය | විෂයයන්<br>ථේරවාද බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම<br>01 | බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය<br>02 | අභිධර්මය<br>03 | බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය<br>04 | බෞද්ධ සමාජ දර්ශනය<br>05 | ඌන සාමර්ථ්‍යයක් නම් එම අවස්ථාවේදී විභාගයට පෙනී සිටි විභාග අංකය | ඌන සාමර්ථ්‍යය ලබා ගත් වර්ෂය | ගෙවූ මුදල (රුපියල්)<br>**නිදහස් නම් "F" ලියන්න** | අයදුම්කරුගේ අත්සන |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

15.0 දහම් පාසල් ප්‍රධානාචාර්යගේ සහතිකය:

ඉහත නම් සඳහන් අයදුම්කරුවන්, මෙම දහම් පාසලේ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් බවත්, ගැසට් නිවේදනයේ 04 වන ඡේදය යටතේ දක්වා ඇති අවශ්‍යතාවන් සපුරා ඇති බවත්, ඔවුන් මා ඉදිරියේදී අත්සන් තැබූ බවත් අයදුම්කරුවන් ............................................... ගෙන් අයකර ගන්නා ලද මුළු මුදල වන රුපියල් ...............................................ක් තැපැල් කාර්යාලයට ගෙවා ඒ වෙනුවෙන් ලද අංක ................................... හා ...................................... දින දරන කුවිතාන්සිය පසු පිටුවේ අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

දහම් පාසලේ නම / ලිපිනය සහිත මුද්‍රාව තබන්න.

සකස් කළේ : නම .................................................................

අත්සන : ...................................... දිනය .......................

පරීක්ෂා කළේ : නම .................................................................

අත්සන : ...................................... දිනය .......................

දහම් පාසල් ප්‍රධානියාගේ නම : ...............................................................

අත්සන : ............................................................ දිනය ..........................

## අයදුම්පත පිරවීම සඳහා උපදෙස්

1.0 දහම් පාසලේ නම සහ ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න. (දහම් පාසලේ නම පළමුවෙන් ද තැපැල් ලිපිනය එයට යටින් ද සඳහන් කරන්න.)

1.1 දහම් පාසල අයත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

1.2 පහත සඳහන් ලේඛනයට අනුව දහම් පාසල අයත් දිස්ත්‍රික්කයට අදාළ අංකය ද නිවැරදිව සඳහන් කරන්න.

1.3 දහම් පාසලේ දුරකථන අංකය සඳහන් කරන්න.

2.0 ඔබ දහම් පාසලට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති ඉලක්කම් 7කින් යුත් පරිගණක අංකය (SCH. NO.) අදාළ කොටුව තුළ සඳහන් කරන්න.

2.1 එක් එක් මාධ්‍යය අනුව විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් සංඛ්‍යාව හා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව අදාළ කොටු තුළ සඳහන් කරන්න. එක් පත්‍රිකාවකට වඩා භාවිත කරන්නේ නම් මුළු අයදුම්කරුවන් ගණන මුල් පිටුවට නිවැරදිව ගෙන ආ යුතුය.

3.0 මෙහි පහතින් දක්වා ඇති ලේඛනයෙන් විභාගයට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය තෝරන්න. මෙහිදී වඩාත් පහසු නගරය පළමු තේරීම ලෙස ද විකල්ප ලෙස යොදා ගත හැකි නගරයක් දෙවන තේරීම ලෙස ද අදාළ නගර අංක ද සමඟ ඇතුළත් කරන්න.

4.0 එක් පත්‍රිකාවක ඇතුළත් කරන අයදුම්කරුවන්ට අදාළ අනු අංක 01, 02, 03,... ආදි වශයෙන් සඳහන් කරන්න. නමක් ඇතුළත් කිරීම සෑමවිටම අලුත් රූලකින් ආරම්භ කරන්න. එක් පත්‍රිකාවක් ප්‍රමාණවත් නොවන්නේ නම්, තවත් මෙවැනි පත්‍රිකාවක් යොදා ගත යුතු අතර අවසාන පත්‍රිකාවේ අවසන් අයදුම්කරු දක්වාම අනු අංක පිළිවෙළට සඳහන් කරන්න.

5.0 ජාතික හැඳුනුම්පතෙහි සඳහන් ආකාරයටම වාසගම සහිත සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතුය. (මුල් පිටුවේ 5.0 කොටුවේ දී ඇති උදාහරණ බලන්න. තව ද නම ඇතුළත් කිරීම සඳහා එක් රූලක් ප්‍රමාණවත් නොවන විටක, ඊළඟ රූල ද යොදා ගත හැකි අතර ඒ අනුව 4.0 වන තීරුවේ අනු අංක නිවැරදිව සටහන් කිරීමට වග බලා ගන්න.) සිංහල හා ඉංග්‍රීසි යන එක් එක් මාධ්‍යයෙන් පෙනී සිටීමට නියමිත පැවිදි අයදුම්කරුවන්ගේ නම් මුලින් ද ගිහි අයදුම්කරුවන්ගේ නම් ඊළඟට ද මාධ්‍ය පිළිවෙළින් ඇතුළත් කරන්න.

6.0 සියලුම අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍ර අංකය හෝ නිවැරදිව සඳහන් කරන්න. ඇතුළත් කරන එම අංකයට අදාළ ලේඛනයේ ජායා පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා ළඟ තබා ගත යුතු වේ.

7.0 පෙනී සිටින මාධ්‍යය සිංහල නම් අංක 2 ද ඉංග්‍රීසි නම් අංක 4 ද සඳහන් කරන්න.

8.0 ස්ත්‍රී/ පුරුෂ භාවය සඳහන් කිරීමේදී පුරුෂ නම් 0 ද ස්ත්‍රී නම් 1 ද සඳහන් කරන්න.

9.0 එක් එක් අයදුම්කරුවන්ගේ ජංගම දුරකථන අංකය සඳහන් කරන්න.

10.0 ඉල්ලුම් කරන විෂයයන් සටහන් කිරීමේදී එක් එක් විෂයයට අදාළ අංකය (01, 02, 03, 04, 05) යොදන්න. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට නම් ඊට අදාළ විෂය අංකය සඳහන් කරන්න.

11.0 සම්පූර්ණ විභාගයට පෙනී සිට එක් විෂයයක් අසමත් වන අයදුම්කරුවන් ඌන සමත් ලෙස සලකන අතර, එම අසමත් විෂයය සඳහා පමණක් පෙනී සිට සාමර්ථ්‍යය ලබා ගැනීමෙන් විභාගය සම්පූර්ණ කළ හැකිවේ. ඒ අනුව අදාළ අයදුම්කරුවන් ඌන සාමර්ථ්‍යය ලත් වර්ෂයේ විභාග අංකය සඳහන් කරන්න.

12.0 ඌන සාමර්ථ්‍යය ලත් වර්ෂය සඳහන් කරන්න.

13.0 මෙම විභාගය සඳහා පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුවේ. ගාස්තුවලින් නිදහස් අයදුම්කරුවන්ගේ නම් ඉදිරියෙන් **"F"** යනුවෙන් සඳහන් කරන්න. සියලු ගෙවීම්වලට අදාළ ලදුපතේ මුල් පිටපත **16** හි අලවා එවිය යුතු වේ.

| පෙනී සිටින අවස්ථාව | දහම් පාසල් අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු විභාග ගාස්තු | බාහිර අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු විභාග ගාස්තු |
|---|---|---|
| ප්‍රථම වතාව | නිදහස් | රු. 200/- |
| දෙවන වතාව සහ ඊට පසු වතාව | රු. 200/- | රු. 200/- |
| ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා | රු. 50/- | රු. 50/- |

14.0 තම නම, තමන් පෙනී සිටින විෂයයන් හා අයදුම්කරුවන්ගේ අනෙකුත් තොරතුරු සියල්ල නිවැරදි දැයි පරීක්ෂා කිරීමෙන් අනුතුරුව තම අත්සන යොදන ලෙසට අයදුම්කරුවන් දැනුවත් කර අයදුම්කරුවන්ගේ අත්සන් ලබා ගන්න.

15.0 අයදුම්කරුවන්ගේ නම්, ඔවුන්ගේ අත්සන්, ගෙවන ලද විභාග ගාස්තු හා අනෙකුත් තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කර බලා දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් අත්සන් කර නම හා දිනය ද සඳහන් කළ යුතුය. වෙන් කර ඇති ස්ථානයේ දහම් පාසලේ මුද්‍රාව තබන්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම දහම් පාසල් ප්‍රධානියාගේ වගකීම වේ.

## විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක /නගර ලේඛනය

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

**16**

තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය මෙහි අලවන්න.